මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015

Primary Piriven Year End Term Test - 2015

5 ශ්‍රේණිය/Grade 5

භූගෝල විද්‍යාව

Geography

කාලය : පැය 03 යි.

Time : Three hours.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved)

I වන හා II වන කොටස්වල ප්‍රශ්න සියල්ලටත්, III වන කොටසින් ප්‍රශ්න තුනකටවත් පිළිතුරු ලියන්න.

## I කොටස.

(01) කෙටි පිළිතුරු සපයන්න.

i. සූර්යයා සෘජුව ම සමකයට මුදුන් වන්නේ කුමන දිනවල ද?

(ලකුණු 04)

ii. පෘථිවිය නිර්මාණය වී ඇත්තේ ප්‍රධාන හා අප්‍රධාන තැටිවලිනි. ඉන් ප්‍රධාන තැටි දෙකක් නම් කරන්න.

(ලකුණු 04)

iii. භූමි කම්පාවක් යන්න කෙටියෙන් විග්‍රහ කර, ඒ මගින් පිටකරන තරංග වර්ගයක් නම් කරන්න.

(ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ තෙත් හා වියළි කලාපවල දක්නට ලැබෙන ප්‍රධාන පස් වර්ගය බැගින් නම් කරන්න.

(ලකුණු 04)

v. ස්වාභාවික ආපදාවක් වන "නායයාම්" කෙරෙහි බලපාන භෞතික හා මානව සාධක දෙක බැගින් නම් කරන්න.

(ලකුණු 04)

vi. මෝසම් දේශගුණය ආශ්‍රිතව බලපාන ප්‍රබල සුළං වර්ග දෙක නම් කරන්න.

(ලකුණු 04)

vii. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන වෘක්ෂලතා වර්ග දෙකක් ලියන්න.

(ලකුණු 04)

viii. ලෝකයේ ජන සංඛ්‍යා පිරමීඩය වෙනස් වෙමින් පවතී.ඒ සඳහා බලපාන හේතු දෙකක් පහදන්න.

(ලකුණු 04)

ix. වර්තමාන ලෝකයේ මෝටර් රථ සඳහා ප්‍රමුඛ රටවල් දෙකක් නම් කරන්න.

(ලකුණු 04)

x. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හේතුවෙන් ඇති විය හැකි භෞතික ප්‍රතිඵල දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 04)


(ලකුණු 04 x 10= 40)

මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය 2015

භූගෝල විද්‍යාව

විභාග අංකය :- ........................

(02) සමෝච්ඡ රේඛා සිතියම.




සමෝච්චරේඛා අන්තරය මීටර 20

පරිමාණය :- 1:50,000

| (i) | (ii) | (iii) | (iv) | (v) | (vi) | (vii) | (viii) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

## II කොටස.

(02) ඔබ වෙත සපයා ඇති 1:50,000 සමෝච්ඡ රේඛා සිතියම අධ්‍යයනය කර (i) සිට (viii) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සිතියම මත සම්මත වර්ණවලින් දක්වන්න.

i. මීටර 120 ට වඩා උස්බිම් සේයා කරන්න.

(ලකුණු 01)

ii. AB, CD, EF හා GH යන රේඛාවලින් ඇඳ ඇති භූ ලක්ෂණ පහත දී ඇති ලැයිස්තුවෙන් නිවැරදිව තෝරා අදාළ රේඛාව ආශ්‍රිතව ලියා දක්වන්න. (මැද බෑවුම, කොත් කන්ද, නෙරුව,දළ බෑවුම)

(ලකුණු 04)

iii. ප්‍රධාන ගංගාවට එක්වන අතු ගංගා දෙකක් අඳින්න.

(ලකුණු 02)

iv. ප්‍රධාන මාර්ගය හා ගංගාව හමුවන ස්ථානයට මදක් උතුරින් ආරම්භ වන අප්‍රධාන මාර්ගය ගඟට සමාන්තරව බටහිර දෙසට දිවගොස් ප්‍රදේශයෙන් පිට වේ. එම මාගීය අඳින්න.

(ලකුණු 01)

v. සෙසු මාර්ගය හා ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානයේ ජනාවාසයකි.එහි පාසල, පොලීසිය හා රෝහල ඇඳ දක්වන්න.

(ලකුණු 03)

vi. නැගෙනහිර මායිමේ උතුරු, දකුණු විහිදෙන කඳුවැටියේ රබර් වගාව ද ගංගා නිම්නය ආශ්‍රිතව පිහිටි කුඹුරු යාය ද අඳින්න.

(ලකුණු 02)

vii. සිතියම් ප්‍රදේශයේ වර්ග ඵලය වර්ග කිලෝ මීටර්වලින් සොයන්න.

(ලකුණු 01)

viii. ප්‍රදේශයේ ආර්ථික කටයුතු පිළිබඳ ව කෙටි විස්තරයක් සපයන්න.

(ලකුණු 01)

## III කොටස.

(03) i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි බෝග මොනවාදැයි නම් කරන්න.

(ලකුණු 03)

ii. ඉන් එක් වැවිලි භෝගයක් තෝරා ගෙන ඒ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. එම නිෂ්පාදන කර්මාන්ත ලෝක වෙළඳපලේ දී මුහුණ දෙන ගැටලු දෙකක් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(04) i. වර්තමානයේ ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් හතරක් ලියන්න.

(ලකුණු 04)

ii. මෝටර් රථ කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවණතා තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. මෝටර් රථ කර්මාන්තය මුහුණපාන ගැටලු දෙකක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(05) i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප තුනක් නම් කරන්න.

(ලකුණු 03)

ii. ශ්‍රී ලංකාව සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට බලපා ඇති සාධන තුනක් විස්තර කරන්න.

(ලකුණු 06)

iii. සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායකවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(06) i. ලොව ප්‍රධාන ජනාධික කලාප දෙකක් සහ ජනහීන කලාප දෙකක් නම් කරන්න.
(ලකුණු 04)

ii. ලෝකයේ ජනාධික කලාප බිහිවීම කෙරෙහි බලපා ඇති හේතු තුනක් විස්තර කරන්න.
(ලකුණු 06)

iii. ජනහීන කලාපවල ජීවත්වන ජනයා මුහුණපාන භෞතික ගැටලු දෙකක් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

(07) i. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව හඳුනා ගත හැකි ප්‍රධාන භූ ලක්ෂණ තුනක් නම් කරන්න.
(ලකුණු 03)

ii. මධ්‍යම කඳුකරයේ මෑත කාලීනව පැන නැගී ඇති පාරිසරික ගැටලුවක් නම් කර, ඒ සඳහා ගෙන ඇති පිළියම් මොනවාදැයි පෙන්වා දෙන්න.
(ලකුණු 06)

iii. මධ්‍යම කඳුකරයේ ජලවහන රටාවේ කැපී පෙනෙන ලක්‍ෂණ පැහැදිලි කරන්න.
(ලකුණු 06)

(08) i. ඛණිජතෙල් හා ගල්අඟුරු හැර ලෝක බලශක්තීන් ලෙස හඳුන්වන ප්‍රභවයන් තුනක් ලියන්න.
(ලකුණු 03)

ii. රටක ආර්ථික දියුණුව කෙරෙහි බලශක්තිය දායක වන ආකාරය විස්තර කරන්න.
(ලකුණු 06)

iii. වර්තමානයේ විකල්ප බලශක්ති මූලාශ්‍ර කෙරෙහි යොමු වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.
(ලකුණු 06)